සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 2025
## Second Term Test - 2025

| 7 ශ්‍රේණිය | පුරවැසි අධ්‍යාපනය | කාලය පැය 02 යි |
|---|---|---|

නම/ විභාග අංකයඃ

## I - කොටස

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමිවේ.**
- **අංක 01සිට 05 දක්වා ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියා දක්වන්න.**

01. ජන සමාජයේ කුඩාම සමාජ ඒකකය ............................................ ලෙස හැඳින්වේ. (පවුල / පාසල / ග්‍රාම නිලධාරී කොට්ඨාසය)

02. මිනිසා තුළ ඇතිවන අයහපත් චිත්තවේගයකි ....................................................... (සතුට / දයාව / කෝපය)

03. අප අයිතිවාසිකම් භුක්ති විඳිමින් ......................................................................... ඉටු කළ යුතුය. (අයිතිවාසිකම් / යුතුකම් / සම්ප්‍රදායන්)

04. ක්‍රීඩාවල නිරත වීමෙන් පුද්ගලයා තුළ වර්ධනය නොවන ගුණාංගයකි ............................................................ (වින්දනය හා සතුට / ශෝකය / නීති ගරුක බව)

05. කාලගුණ අනාවැකි, විනිමය අනුපාත, වෙළඳපළ මිල ගණන් ආදිය ජනමාධ්‍ය මගින් ................................................................ ඉදිරිපත් කෙරෙන තොරතුරු ය. (මාසිකව / වාර්ෂිකව / දෛනිකව)

- **ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවල දැක්වෙන ප්‍රකාශ හරිනම් (✓) ලකුණු ද වැරදිනම් (✗) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

06. න්‍යෂ්ටික පවුලකට සාපේක්ෂව විස්තෘත පවුලක සාමාජික සංඛ්‍යාව අඩුය. ( )

07. ජීවන අරමුණු ඉටුකර ගැනීමට එම අරමුණු සිත තුළ තිබීම පමණක් ප්‍රමාණවත් ය. ( )

08. සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම්වල යෙදීමේ වාසියක් ලෙස චිත්තවේග පාලනය කිරීමේ හැකියාව ලැබේ. ( )

09. ජන සමාජයක පවත්නා අන්තර් සම්බන්ධතා එම ජන සමාජයේ පැවැත්මට හේතු නොවේ. ( )

10. අධ්‍යාපනය ලැබීමේ අයිතිය පුද්ගලයාට හිමිවන සිවිල් අයිතිවාසිකමකි. ( )

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවල දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

11. පවුලේ සාමාජිකයෙකු ලෙස ඔබගේ යුතුකමක් හා වගකීමක් වන්නේ,

    (1) ආහාර හා පෝෂණය ලැබීම. (2) අධ්‍යාපනය ලැබීම.

    (3) පවුලේ ගෞරවය ආරක්ෂා කිරීම. (4) රැකවරණය ලැබීම.

12. පුද්ගලයෙකු තුළ පැවතිය යුතු යහපත් ගුණාංගයක් නොවන්නේ,

(1) අවංක බව

(2) ස්වයං විනය

(3) නායකත්වයට ගරු කිරීම

(4) යහපත් දේ ප්‍රතික්ෂේප කිරීම

13. පහත සඳහන් කරුණු අතරින් සදාචාරාත්මක යුතුකමක් වන්නේ,

(1) බදු ගෙවීම

(2) රාජකාරිය නිසි ලෙස ඉටු කිරීම

(3) දෙමාපියන්ට සැලකීම

(4) රජයට අවනත වීම

14. රාජ්‍ය සේවකයින් විශ්‍රාම යා හැකි අනිවාර්ය වයස් සීමාව වන්නේ,

(1) අවුරුදු 55 (2) අවුරුදු 57

(3) අවුරුදු 60 (4) අවුරුදු 65

15. ළමා ශ්‍රමය සූරාකෑමට එරෙහි සාප්පු හා කාර්යාල පනතට අනුව සේවයේ යෙදවීමට නොහැක්කේ,

(1) වයස අවුරුදු 12 ට අඩු දරුවන්.

(2) වයස අවුරුදු 14 ට අඩු දරුවන්.

(3) වයස අවුරුදු 16 ට අඩු දරුවන්.

(4) වයස අවුරුදු 18 ට අඩු දරුවන්.

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.**

(සම්ප්‍රදායන් / වගකීම් / අසල්වාසීන් / දේශපාලන / සදාචාරාත්මක)

16. ජන සමාජයක පවුල මගින් අන්තර් සම්බන්ධතා පවත්වන ආසන්නතමයා වන්නේ ................................. ය.

17. කැමති ආණ්ඩුවක් පත්කර ගැනීම පුද්ගලයාට හිමි ................................................................. අයිතිවාසිකමකි.

18. නීතිමය හා ........................................................................................ යුතුකම් වශයෙන් යුතුකම් වර්ග කෙරේ.

19. යුතුකම් ඉටු කිරීමට ඇති බැඳීම ............................................................................................. ලෙස හැඳින්වේ.

20. දීර්ඝ කාලයක් තිස්සේ පැවත එන සිරිත් විරිත් ........................................................................ ලෙස හැඳින්වේ.

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නයත් 2 - 7 දක්වා ප්‍රශ්නවලින් ප්‍රශ්න 4 කුත් තෝරාගෙන ප්‍රශ්න 05 කට පිළිතුරු ලියන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 16 ක්ද, 2 - 7 දක්වා ප්‍රශ්නවලට ලකුණු 11 බැගින් ද හිමිවේ.

01. (i) සාමාජිකත්වය අනුව පවුල බෙදෙන ප්‍රධාන කොටස් දෙක ලියන්න. (ලකුණු 02)

(1) ..............................

(2) ..............................

(ii) ඔබට පවුලෙන් ලැබෙන අයිතිවාසිකම් හා ඒ එක් එක් අයිතිවාසිකම සඳහා ඔබෙන් ඉටුවිය යුතු යුතුකම් පහත වගුව තුළ ලියන්න. (ලකුණු 08)

| අයිතිවාසිකම් | යුතුකම් |
|---|---|
| 1. .............................. | 1. .............................. |
| 2. .............................. | 2. .............................. |
| 3. .............................. | 3. .............................. |
| 4. .............................. | 4. .............................. |

(iii) යහපත් පුරවැසියෙකු සතු විය යුතු ගුණාංග 04 ක් ලියන්න. (ලකුණු 04)

(1) ..............................

(2) ..............................

(3) ..............................

(4) ..............................

(iv) අයිතිවාසිකම් බෙදෙන ප්‍රධාන කොටස් දෙක ලියන්න. (ලකුණු 02)

(1) ..............................

(2) ..............................

02. (i) ජන සමාජයේ පවත්නා හිතකර බලවේග 04 ක් ලියන්න. (ලකුණු 04)

(1) ..............................

(2) ..............................

(3) ..............................

(4) ..............................

(ii) විවේක කාලය ඵලදායීව ගත කිරීම සඳහා කළ හැකි ක්‍රියාකාරකම් 04 ක් ලියන්න. (ලකුණු 04)

(1) ..............................................................................................................

(2) ..............................................................................................................

(3) ..............................................................................................................

(4) ..............................................................................................................

(iii) ක්‍රීඩාවල යෙදීමෙන් පුද්ගලයෙකු තුළ වර්ධනය වන ගුණාංග 03 ක් ලියන්න. (ලකුණු 03)

(1) ..............................................................................................................

(2) ..............................................................................................................

(3) ..............................................................................................................

03. (i) පහත රූප සටහන්වලට අදාළ චිත්තවේග හඳුන්වන්න. (ලකුණු 04)



A B C D

(A) ..............................................................................................................

(B) ..............................................................................................................

(C) ..............................................................................................................

(D) ..............................................................................................................

(ii) අයහපත් චිත්තවේග පාලනය කර ගැනීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාකාරකම් 04 ක් ලියන්න. (ලකුණු 04)

(1) ..............................................................................................................

(2) ..............................................................................................................

(3) ..............................................................................................................

(4) ..............................................................................................................


(iii) ඇසුරුම් සහිත නිෂ්පාදනවල මුද්‍රණය කර තිබිය යුතු කරුණු 03 ක් ලියන්න. (ලකුණු 03)

(1) ..............................................................................................................

(2) ..............................................................................................................

(3) ..............................................................................................................

04. (i) පවුලක ඇති අන්තර් සම්බන්ධතා දැක්වෙන පහත රූප සටහනේ හිස්තැන් සම්පූර්ණ කරන්න. (ලකුණු 03)




(ii) ජන සමාජයේ ඇති ආයතන ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න. (ලකුණු 08)

| ආයතනය | එමගින් සමාජයට ඉටුවන සේවය |
|---|---|
| උදා.:- මරණාධාර සමිති | අවමංගල්‍යාධාර සේවා ලබාදීම |
| 1. ............................................................... | 1. ............................................................... |
| 2. ............................................................... | 2. ............................................................... |
| 3. ............................................................... | 3. ............................................................... |
| 4. ............................................................... | 4. ............................................................... |

05. (i) සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් කීපයක් පහත දැක්වේ. ඒවා වෙන්කර දක්වන්න. (ලකුණු 06)
(ජීවත් වීමේ අයිතිය / ඡන්දය ප්‍රකාශ කිරීම / රැකියාවක් කිරීම / අධ්‍යාපනය ලැබීම / රජයේ තනතුරු දැරීම / ආණ්ඩුව විවේචනය කිරීම)

| සිවිල් අයිතිවාසිකම් | දේශපාලන අයිතිවාසිකම් |
|---|---|
| 1. ............................................................... | 1. ............................................................... |
| 2. ............................................................... | 2. ............................................................... |
| 3. ............................................................... | 3. ............................................................... |

(ii) පහත අයිතිවාසිකම් හා බැඳුණු යුතුකම් ඉදිරියෙන් ලියන්න. (ලකුණු 03)

(1) අධ්‍යාපනය ලැබීම - ..........................................................................................

(2) ජීවත් වීම - ..........................................................................................

(3) කැමති ආගමක් ඇදහීම - ..........................................................................................

(iii) මිනිසා විසින් ප්‍රගුණ කළ යුතු උතුම් මානව ගුණාංග 02 ක් ලියන්න. (ලකුණු 02)

(1) ..........................................................................................................

(2) ..........................................................................................................


06. (i) රැකියාවක යෙදීමෙන් අත්වන ප්‍රයෝජන 03 ක් ලියන්න. (ලකුණු 03)

(1) ..........................................................................................................

(2) ..........................................................................................................

(3) ..........................................................................................................

(ii) ඥාතීත්වය හැඳින්වීම සඳහා භාවිත කරන ඇමතුම් පද අනුව පහත සටහනේ හිස්තැන් සම්පූර්ණ කරන්න. (ලකුණු 06)




1. .................... 2. .................... 3. .................... 4. .................... 5. .................... 6. ....................

(iii) පහත දැක්වෙන සිරිත් විරිත් හා සම්ප්‍රදායන් වෙන්කර දක්වන්න. (ලකුණු 02)
(නව නිවසකට මුල්ගල තැබීම / දිනපතා ආගම සිහිකිරීම / පවුලේ සාමාජිකයන් එක්ව ආහාර ගැනීම / දරුවන්ට අකුරු කියවීම)

| සිරිත් විරිත් | සම්ප්‍රදායන් |
|---|---|
| 1. ............................................................. | 1. ............................................................. |
| 2. ............................................................. | 2. ............................................................. |

07. (i) සේවක නීති නිසි පරිදි ක්‍රියාත්මක නොවීම නිසා ඇතිවිය හැකි අවාසි 04 ක් ලියන්න. (ලකුණු 04)

(1) ..........................................................................................................................

(2) ..........................................................................................................................

(3) ..........................................................................................................................

(4) ..........................................................................................................................

(ii) පහත දැක්වෙන යුතුකම් නීතිමය යුතුකම් හා සදාචාරාත්මක යුතුකම් ලෙස වෙන්කර ලියන්න. (ලකුණු 04)

(නීතිය හා සාමය පවත්වාගෙන යාම / වැඩිහිටියන්ට සැලකීම / රාජ්‍ය නීති පිළිපැදීම / ජාතික සංකේතවලට ගරු කිරීම)

| නීතිමය යුතුකම් | සදාචාරාත්මක යුතුකම් |
|---|---|
| 1. ............................................................. | 1. ............................................................. |
| 2. ............................................................. | 2. ............................................................. |

(iii) ළමා ශ්‍රමිකයන් සේවයේ යෙදවීමෙන් ඇතිවන බලපෑම් 03 ක් ලියන්න. (ලකුණු 03)

(1) ..........................................................................................................................

(2) ..........................................................................................................................

(3) ..........................................................................................................................

## I කොටස

01. පවුල 02. කෝපය 03. යුතුකම් 04. ශෝකය 05. දෛනිකව 06. × 07. ×
08. ✓ 09. × 10. ✓ 11. පවුලේ ගෞරවය ආරක්ෂා කිරීම 12. යහපත් දේ ප්‍රතික්ෂේප කිරීම
13. දෙමාපියන්ට සැලකීම 14. අවුරුදු 60 15. වයස අවුරුදු 14 ට අඩු දරුවන් 16. අසල්වාසීන්
17. දේශපාලන 18. සදාචාරාත්මක 19. වගකීම 20. සම්ප්‍රදායන්

## II කොටස

01. (i) (1) න්‍යෂ්ටික පවුල (2) විස්තෘත පවුල

(ii)
- ආහාර හා පෝෂණය - නිවැරදි ආහාර රටාව
- සෞඛ්‍ය පහසුකම් - නිරෝගීව සිටීම
- ඇඳුම් පැළඳුම් - අරපරෙස්සම
- ආදරය, දයාව, කරුණාව - පෙරළා ඔවුන්ට ආදරය කිරීම
- ආරක්ෂාව - ආරක්ෂාකාරීව සිටීම
- අධ්‍යාපනය - හොඳින් ඉගෙන ගැනීම

(iii) අවංක බව / ඉවසීම / ස්වයං විනය / පරාර්ථකාමී බව (38 පිටුව)

(iv) සිවිල් අයිතිවාසිකම් / දේශපාලන අයිතිවාසිකම්

02 (i) පවුල / පාසල / ආගමික ආයතන / කලණ මිතුරන් / හොඳ පොත් පත් / හොඳ මාධ්‍ය වැඩසටහන්

(ii) ක්‍රීඩා කිරීම / නිර්මාණකරණය / සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම් / පරිසරය නිරීක්ෂණය කිරීම

(iii) ජය පරාජය සතුටින් විඳ දරා ගැනීම / නීති ගරුක බව / විධාන පිළිපැදීම / කණ්ඩායම් හැඟීම / වින්දනය හා සතුට / සාධාරණත්වය

03. (i) (1) සතුට (2) දුක (3) බිය (4) කෝපය

(ii) ආගමික කටයුතුවල යෙදීම / සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම් / ඇවිදීම / පොත් කියවීම / ක්‍රීඩා කිරීම / පරිසරය නැරඹීම

(iii) නිෂ්පාදිත දිනය / කල් ඉකුත්වන දිනය / මිල / බර / අඩංගු ද්‍රව්‍ය

04. (i) (1) සහෝදර සහෝදරියන් (2) පියා (3) ඥාතීන්

(ii)
- ආගමික සංවිධාන - ආධ්‍යාත්මික සංවර්ධනය / ආගම ඉගැන්වීම
- ග්‍රාම සංවර්ධන සමිති - පොදු සේවා / සුබ සාධන / සංවර්ධන
- ක්‍රීඩා සංවිධාන - ක්‍රීඩා කටයුතු / විනය / නායකත්වය තැනීම
- වෘත්තීය සමිති - වෘත්තීය සුරක්ෂිත බව / අයිතිවාසිකම්
- යෞවන සමාජ - යෞවන දක්ෂතා / තරඟ / ඉදිරිපත් වීම්

05. (i)
- සිවිල් → ජීවත්වීම / රැකියාවක් කිරීම / අධ්‍යාපනය ලැබීම
- දේශපාලන → ඡන්දය ප්‍රකාශ කිරීම / රජයේ තනතුරු දැරීම / ආණ්ඩුව විවේචනය කිරීම

(ii) (1) හොඳින් ඉගෙන ගැනීම. (2) අන් අයට කරදරයක් නොවන ලෙස ජීවත්වීම. (3) වෙනත් ආගමික කොටස්වලට හිරිහැර නොකිරීම.

(iii) යුතුකම් ඉටු කිරීම / නීතිගරුක බව / දයාව / කරුණාව / අවංක බව / විනයගරුක බව / අයිතිවාසිකම් වලට ගරු කිරීම / අන්මත ඉවසීම

06. (i) පවුලේ එදිනෙදා අවශ්‍යතා ඉටුකර ගැනීමට හැකිවීම / අවශ්‍යතා ඉටුකර ගැනීමට ප්‍රමාණවත් ආදායමක් ලැබීම / ජීවන තත්වය යහපත් වීම / ආදායමෙන් කොටසක් ඉතිරි කිරීමට හැකිවීම

(ii) (1) සීයා (2) බාප්පා (3) ලොකු අම්මා (4) පුංචි අම්මා (5) ආච්චි (6) මස්සිනා

(iii)
- සිරිත් විරිත් - නව නිවසකට මුල්ගල තැබීම / දරුවන්ට අකුරු කියවීම
- සම්ප්‍රදායන් - දිනපතා ආගම සිහිකිරීම / පවුලේ සාමාජිකයන් එක්ව ආහාර ගැනීම

07. (i) ශ්‍රමය සූරාකෑම / සේවක අතෘප්තිය / සාධාරණ වැටුපක් නොලැබීම / වෘත්තීය අනාරක්ෂිත බව / සේවක අසාධාරණකම්

(ii)
- නීතිමය - නීතිය හා සාමය පවත්වාගෙන යාම / රාජ්‍ය නීති පිළිපැදීම
- සදාචාරාත්මක - වැඩිහිටියන්ට සැලකීම / ජාතික සංකේතවලට ගරු කිරීම

(iii) කායික හා මානසික ශක්තිය පිරිහීම / ශ්‍රමය සූරාකෑම / අපයෝජනයට ලක්වීම / අධ්‍යාපනය අහිමිවීම / ළමා කාලය අහිමි වීම